# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

සමාජය හා සාමයික කේන්ද්‍රය
281,
ඩීන්ස් පාර,
කොළඹ 10

**අභියාචක**

අභියාචනා අංක : **832/2022**
**833/2022**

එදිරිව

ශ්‍රී ලංකා පොලිසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා මයා පෙනී සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් ජේ.පී.ඩී ජයසිංහ මයා අධ්‍යක්ෂ (සැපයුම්) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.06.27, 2022.7.18

**දිනය** : 2022.07.18

අද දින මෙම අභියාචනා පරීක්ෂණය සිදු කරනු ලැබූ අවස්ථාවේදී පොදු අධිකාරිය විසින් අභියාචකගේ තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් ගන්නා ලද ස්ථාවරය ඇතුළත් 2022.06.21 දිනැති කොමිෂන් සභාවේ අවධානය සඳහා ඉදිරිපත් කරන ලදී. එකී 2022.06.21 දිනැති ලියවිල්ලට අනුව තොරතුරු පනතේ 5 (ඌ) (ii) වගන්තියට අනුව තොරතුරු මුදා හැරීම සිදු කළ නොහැකි බවට පොදු අධිකාරිය විසින් අභියාචක වෙත දැන්වීමක් සිදු කර ඇත.



Right to Information Commission

මේ සම්බන්ධයෙන් අභියාචක වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ මහතාගේ සහ පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජේ.පී.ඩී ජයසිංහ මහතාගේ කරුණු දැක්වීම් වලට කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී.

2022.05.24 දිනැති තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් හදිසි අවශ්‍යතාවය මත පැය 48 ක කාලයක් තුළ ප්‍රතිචාර දැක්විය යුතුය යන ස්ථාවරය අභියාචක වෙනුවෙන් නඩත්තු කරන ලද අතර මෙතෙක් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් නොලැබීම පිළිබඳවද කොමිෂන් සභාවේ අවධානය විශේෂයෙන් යොමු කරන ලදී.

උක්ත දින දරණ තොරතුරු ඉල්ලීමෙහි අංක 1.1, 1.2 සහ 1.3 අයිතමයන්ට අදාළ තොරතුරු මුදා හැරීම සම්බන්ධයෙන් 2016 අංක 12 දරණ තොරතුරු පනතේ 5 (1) (ඌ) (ii) උපවගන්තිය අදාළ කර ගැනීම සඳහා පසුබිමක් නිර්මාණය වී ඇති බවක් ඉල්ලා ඇති තොරතුරු අනුව ප්‍රදර්ශනය නොවේ. මේ සම්බන්ධයෙන් පොදු අධිකාරියටද නිශ්චිත පසුබිමක් නිර්මාණය වී ඇති බවට කරුණු ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති බවද නොපෙනේ. එබැවින් එවැනි තොරතුරු 5 (1) (ඌ) (ii) උපවගන්තිය යටතේ වාරණයට ලක් කිරීම සුදුසු නොවේ.

මෙම කරුණු සළකා බලා උක්ත සඳහන් තොරතුරු ඉල්ලීමේ 1.4, 1.5, 1.6 සහ 1.7 යන අයිතමයන්ට අදාළ තොරතුරු මුදා හැරීම සම්බන්ධව සහ එම තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය සම්බන්ධව අගතියක් නොවන අයුරින් එකී තොරතුරු ඉල්ලීමෙහි 1.1, 1.2 සහ 1.3 අයිතමයන්ට අදාළ තොරතුරු වහාම මුදා හැරීම සිදු කළ යුතු බවට පෙනී යන බැවින් එකී තොරතුරු මෙම නියෝගය ලද විගස පොදු අධිකාරිය විසින් එම තොරතුරු මුදා හැරීමට ක්‍රියා කළ යුතු බවට අතුරු නියෝගයක් සිදු කිරීමට අපි තීරණය කරමු.

අවසන් නියෝගය සිදු කිරීම ඉදිරි දිනට සිදු කරනු ලබන අතර එදිනට උක්ත තොරතුරු ඉල්ලීමේ 1.4, 1.5, 1.6 සහ 1.7 ට අදාළව පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති ලේඛන කොමිෂන් සභාවේ පරිශීලනය සඳහා ඉදිරිපත් කළ යුතු බවට වැඩිදුරටත් තීරණය කරමු.

දෙපාර්ශවයටම වැඩිදුර සැළකිරීම් සිදු කිරීමට ඇත්නම් ඒ සඳහා දෙපාර්ශවයටම හිමිකම ඇත.

ඒ අනුව වැඩිදුර විමසීම 28.07.2022 දින පෙ.ව 11.45 ට.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

.................................................................
විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති

.................................................................
නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

.................................................................
නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

TRUE COPY



Right to Information Commission

Director/Supplies

ASP/Supplies

Extension 3110

OIC/Supplies

Extension 3112


# පොලිස් සැපයුම් කොට්ඨාශය
# பொலிஸ் விநியோகப் பிரிவு
# POLICE SUPPLIES DIVISION


POLICE HEADQUARTERS 2nd FLOOR, COLOMBO 01, SRI LANKA

D/SUP/ආ/446/2022

My No :

Your No :

Accountant/Supplies

Extension 3113

Chief Management Assi:

Extension 3116

General No: 011-2421111


2022.06.21

සමාජය හා සාමයික කේන්ද්‍රය,
නො. 281,
ඩීන්ස් පාර,
කොළඹ 10.

**<u>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 25 (3) වගන්තිය යටතේ කර ඇති ඉල්ලීම සම්බන්ධව</u>**

උක්ත කරුණට අදාලව අංක RTI/CSR/0052 හා 0053 දරණ විෂය සම්බන්ධව පොලිස්පති තුමා අමතා කර ඇති විමසීම හා බැඳේ.

ඉහත විමසීමට අනුව අයදුම්කර ඇති කරුණු සඳහා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වගන්තියේ (ඌ) ප්‍රකාරව එම තොරතුරු හෙළිදරව් කිරීම මගින් (ii) නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාවට අදාල තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කල හැකිය.

ඒ අනුව ඉල්ලා ඇති තොරතුරු සහ ලේඛන වල පිටපත් ලබාදීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

අධ්‍යක්ෂ / සැපයුම්

පිටපත් :- i. **අභියාචනා අංක - RTIC / Appeal / 832/2022**
අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව, කාමර අංක 203-204, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. (අවශ්‍ය කටයුතු සඳහා).

ii. ජ්‍යෝ.නි.පො.ප. (සහයකසේවා) - කා.දැ.ගැ.

iii. නි.පො.ප. (ප්‍රවර්ථන) - කා.දැ.ගැ.

iv. ගොනුවට.